# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1796/40 - 2013 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා - 2013.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරන හා විගණන ප්‍රමිති පනත**

4(2) වගන්තිය යටතේ කරනු ලබන පළ කිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මෙහි මින් මතු “ආයතනය” යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, ආයතනය විසින් 2011 දෙසැම්බර් මස 7 වැනි බදාදා දින අංක 1735/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද SLFRS 7 - මූල්‍ය සාධන පත්‍ර : හෙළිදරව් කිරීම සහ 2011 දෙසැම්බර් මස 30 වැනි සිකුරාදා දින අංක 1738/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද එම ප්‍රමිතියට පසුව කරන ලද වෙනස් කිරීම්.

මෙම ප්‍රමිතිය බලාත්මක වන දිනය සහ සංක්‍රාන්ති කොටසට පහත සඳහන් ඡේදය (44 වැනි ඡේදය ලෙස) එකතු කිරීමට ආයතනය යෝජනා කොට සම්මත කර ගෙන ඇත.

44 වැනි ඡේදය

2013 ජනවාරි මස 01 වැනි දිනට පෙර ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදයන් සඳහා අස්තිත්ත්වයක් මෙම SLFRS ව්‍යවහාර කරන්නේ නම් එය මූල්‍ය සාධන පත්‍ර වලින් පැන නගින අවදානම් වල ස්වභාවය සහ ප්‍රමාණය සම්බන්ධයෙන් 31-42 ඡේද වලින් හෙළිදරව් කිරීම් අවශ්‍ය කරන තුලනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2013 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දී ය.

02-808


1A - PG 001555 — 345 (2013/02)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.